නගර සහ කඩවත් ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට නගර සහ කඩවත් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

සභාව මුදල් හා උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. එනමුත් වර්ගීකරණ සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුදල් පොත අනුව 2017 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් දෙකක පිළිවෙලින් රු.8,171,992 ක් සහ රු.1,267,346 ක් වූ ශේෂ මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් රු.8,511,201 ක් හා රු.1,238,839 ක් ලෙස පෙන්නුම් කිරීම නිසා බැංකු ශේෂ රු.310,762 කින් වැඩියෙන් පෙන්නුම් කෙරිණි. සභාව මෙය හඳුනාගෙන අවශ්‍ය ගැලපුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ණය ලේඛනය අනුව රු.14,750,053 ක් වූ සේවක ණය මූල්‍ය ප්‍රකාශනවල රු. 16,663,777 ක් ලෙස පෙන්වා තිබීම නිසා සේවක ණය රු.1,913,724 කින් වැඩියෙන් දැක්විණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම
-------------------------------------

රු.12,454,562 ක් හිඟ වරිපනම් සහ බදු සඳහා කාල විශ්ලේශණයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එනිසා, විගණනයේදී ශේෂ තහවුරු කළ නොහැකි විය.

### 1.3.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති පරිච්ඡේදය X වගන්තිය 193 | විගණකාධිපතිට ඉදිරිපත් කිරීම සඳහා විචලනයන්ට හේතු පැහැදිළි කරනු පිණිස තත්‍ය ආදායම් හා වියදම් අයවැයගත ආදායම් හා වියදම් සමඟ සසඳා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 03 සිට 05 දක්වා කාලයකට අදාළ රු.12,572,920 ක් වූ මිශ්‍ර තැන්පතු, ටෙන්ඩර් තැන්පතු සහ කොන්ත්‍රාත් තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. **මූල්‍ය සමාලෝචනය**

### 2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,272,975 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.36,592,654 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.14,319,589 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

### 2.2 **ආදායම් පරිපාලනය**

#### 2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | **2017** ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | **2016** ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 26,604 | 22,479 | 26,058 | 12,454 | 24,918 | 25,811 | 25,955 | 15,182 |
| (ii) කුලී | 2,684 | 3,519 | 3,056 | 1,310 | 21,880 | 2,127 | 2,119 | 94 |
| (iii)බලපත්‍ර ගාස්තු | 4,028 | 6,351 | 227 | 99 | 2,072 | 2,075 | 1,951 | 752 |
| (iv)වෙනත් ආදායම් | 25,538 | 11,779 | 7,312 | 4,466 | 15,786 | 19,096 | 7,312 | 11,783 |

(ආ) නිවාස, ගොඩනැගිලි කුලී සහ උප්පුවේල් වෙළඳපොල බදු කුලී වෙනුවෙන් රු.1,604,569 ක මුදලක් අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

-----------------

3.1.1 කොන්ත්‍රාත් ඉදිකිරීම් ප්‍රමාදය

------------------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ, නිතියැපුරි ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2017 සැප්තැම්බර් 18 දින රු.56,726,892 කට කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි. 2017 නොවැම්බර් 07 දින වන විට නිමකළ යුතුව තිබූ කොන්ත්‍රාත්තුව විගණනය සිදුකළ දිනය වූ 2018 අගොස්තු 10 දිනටත් නිමකර නොතිබුණි.

3.1.2 තිරසාර සංවර්ධන ඉලක්ක

---------------------------

2015 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල ප්‍රධානීන්ගේ සමුළුවේදී තීරණය කළ 2030- තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 සමීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වා දෙන ලද සම්බල්තිව් පුස්තකාලයේ පොත් 1486 ක් අස්ථාන ගතවීම පිළිබඳ කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් මූල්‍ය රීති 163.3 ප්‍රකාරව අත්තිකාරම් දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතු වේ. එසේවුවද, වසර 1 සිට 18 වසරක කාලයක් සඳහා වූ රු.2,356,250 ක් වූ අත්තිකාරම් පිළිබඳව එවැනි ක්‍රියාමර්ගයක් ගෙන නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

------------------------

3.3.1 වත්කම් ලියාපදිංචි කිරීම

--------------------------

වෙනත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලබාගත් වාහන 08 ක අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම වාහන වසර 11 ක් තිස්සේ සභාව විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණි.

3.3.2 අක්‍රීය වත්කම්

--------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) පුරනැගුම වැඩසටහන යටතේ 2014 වර්ෂයේදී ඉදිකරන ලද කඩ කාමර 16 න් 08 ක් 2014 පටන් අක්‍රීයව පැවතිණි.

(ආ) 2015 අගෝස්තු 31 දින සම්බල්තිව් සංස්කෘතික මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම සඳහා සභාව තම අරමුදලෙන් රු.900,305 ක් වැය කර තිබුණි. කෙසේවෙතත් එහි විදුලි බලය සහ ජලය නොමැතිකම නිසා 2018 අගෝස්තු 10 දක්වාම ගොඩනැගිල්ල අක්‍රීයව පැවතිණි.

3.4 ප්‍රසම්පාදන පරිපාටි
---------------------

3.4.1 ප්‍රසම්පාදන සැලසුම්
--------------------

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

3.5.1 බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම
-----------------------------------

බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සභාව විසින් රු.5,646,591 ක් ප්‍රතිපාදනය කරනු ලැබ, 2017 ජුනි 14 දින කර්මාන්තය කොන්ත්‍රාත්කරුවෙකුට භාරකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉදිකිරීම සඳහා සභාව විසින් පිළියෙල කළ ඇස්තමේන්තුව රු.6,647,822 ක් වුවද, කොන්ත්‍රාත්තුව රු.5,464,591 කට පිරිනමන ලදුව, සියයට 17.79 ක වෙනසක් ඇතිවී තිබුණි. තාක්‍ෂණ ඇගයීම් කමිටුව කොන්ත්‍රාත්තු වටිනාකමින් සියයට 10 ක්වූ රු.546,459 ක් කාර්යසාධන බැඳුම්කරය වශයෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණි. එසේ වුවද, සභාව රු.273,230 ක මුදලක් පමණක් අයකර තිබුණි.

(ආ) එළඹි ගිවිසුමට අනුව, 2017 මාර්තු 28 දින කර්මාන්තය නිමකර භාරදිය යුතු විය. කෙසේවුවත්, බිම් උලු ඇතිරීම, නාන කාමර භාණ්ඩ සවිකිරීම, ජලය සැපයීම වැනි රු.3,018,276 ක වටිනා කමැති කර්මාන්තයෙන් සියයට 55 ක් වූ වැඩ 2018 අගෝස්තු 10 වන විටත් නිමකර නොතිබුණි. එනමුත් ඒ සම්බන්ධව සභාව කටයුතු කර නොතිබුණි.

3.5.2 ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිකිරීම
------------------------------

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ, ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා 2017 නොවැම්බර් 06 දින රු.3,862,000 ක කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කොන්ත්‍රාත්කරුගේ මුදල, ඇස්තමේන්තු මුදලට සියයට 20 ක් අඩු වූ මුදලක් විය. එසේවුවද, තාක්‍ෂණික ඇගයීම් කමිටුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.9.11 පරිදි කටයුතු කරනු වෙනුවට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට නිර්දේශයක් කර තිබුණි.

(ආ) ඇතැම් වැඩ විෂයයන් සඳහා කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබු මිල ගණන් ඇස්තමේන්තුගත මුදලට වඩා සියයට 30 කට වැඩි නමුත්, තාක්‍ෂණ ඇගයීම් කමිටුව කොන්ත්‍රාත්තුව පරිනැමීමට නිර්දේශ කර තිබුණි.

(ඇ) ඇස්තමේන්තුවේ නියම කර ඇති ආකාරයට සිදුකළ යුතු වැඩ සිදු නොකර, ගොඩනැගිල්ලේ වෙනස්කම් සිදුකර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රු.517,482 ක අතිරේක වැඩ සිදුකර තිබුණි. වෙනස් කිරීම් සිදුකර තිබු නිසා, ගොඩනැගිල්ල සතුටුදායක අන්දමින් ඉදිකර නොතිබුණි.

(ඇ) රු.427,775 ක් වටිනා ඇතැම් වැඩ 2018 අගෝස්තු 10 දක්වාත් නිමකර නොතිබුණි.

3.5.3 වඩාලි පිල්ලෙයාර් කෝවිල් මාර්ගය ප්‍රකෘතිමත් කිරීම

පසුගාමී ප්‍රදේශවල පළාත් පාලන ආයතන සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ, වඩාලි පිල්ලෙයාර් කෝවිල මාර්ගය ප්‍රකෘතිමත් කිරීම සඳහා 2016 දෙසැම්බර් මසදී රු.799,860 ක මුදලකට සභාව කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම කර්මාන්තය සඳහා අවශ්‍ය තාර බැරල්, බැරලයකට රු.5,900 හා ප්‍රවාහන ගාස්තු රු.1000 වශයෙන් සැඳුම්ලත් බැරලයක් සඳහා රු.10,900 ක් බැගින් ඛනිජ තෙල් සංස්ථාවෙන් ලබාගත හැකිව තිබුණි. එනමුත් බැරලයකට රු.13,000 බැගින් රු.58,800 ක වැඩිපුර ගෙවීමක් සිදු කරමින් බැරලයක් රු.13,000 බැගින් බාහිර පාර්ශවයක් වෙතින් බැරල් 28 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) ඇස්තමේන්තුව අනුව, මෙම කර්මාන්තය සඳහා අවශ්‍ය තාර ලීටර් ප්‍රමාණය ලීටර් 4356 ක් විය. එසේවුවත් තාර ලීටර් 5040 ක් (බැරල් 28 ක්) මිලට ගෙන තිබුණි. අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා තාර ලීටර් 684 ක් මිලට ගෙන තිබූ අතර 2017 ජුනි 25 දින සිදු කළ විගණන පරීක්ෂාවේදී එය ඉදිරිපත් නොකෙරිණි. එනිසා පාඩුව රු.49,390 ක් වශයෙන් ඇස්තමේන්තුකරන ලදී. මේ දක්වාම සභාව මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

1988 (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 168(1) වගන්තිය ප්‍රකාර මාර්තු 31 දිනට පෙර මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුව තිබුණි. එසේවුවද, මූල්‍ය ප්‍රකාශන මාස 02 ක ප්‍රමාදයකින් පසුව 2018 ජුනි 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය

ඇස්තමේන්තුගත හා තත්‍ය වියදම් අතර සියයට 9 සිට 71 දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ඵලදායී කළමනාකරණ කාරණයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබූ බැව් පෙන්නුම් කෙරිණි.

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

| පද්ධති හා පාලන | අවධානය අවශ්‍ය කරුණු |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ලෙජර් යාවත්කාලීනව නඩත්තු කිරීම |
| | ii. වියදම් අනුව වත්කම් වර්ගීකරණය |
| (ආ) ස්ථාවර වත්කම් | i. ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීම. |
| | ii. ගබඩා ලෙජර් නිසි පරිදි නඩත්තු කිරීම |
| (ඇ) ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීම |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | i. කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී ප්‍රසම්පාදන පරිපාටි අනුගමනය කළ යුතුය. |
| | ii. නියමිත දිනවලදී කොන්ත්‍රාත්තු නිම කිරීමට කටයුතු කළ යුතුය |